# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2053/30 - 2018 ජනවාරි මස 10 වැනි බදාදා - 2018.01.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත**

15 (1) වැනි වගන්තිය යටතේ නියෝගය

ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 15 (1) වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක වන මම, මෙම නියමයෙන් ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව තුළ වැලිකඩ කොට්ඨාසයේ පිහිටි මෙම පහත උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇති ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව සතු ඉඩම, අද දින සිට නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරමි.

පාඨලී චම්පික රණවක (පා.ම.),<br>
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය.

2018 ජනවාරි මස 05 වැනි දින,<br>
17 හා 18 වන මහල්,<br>
''සුහුරුපාය'' සුභූතිපුර පාර,<br>
බත්තරමුල්ල,<br>
මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

*උපලේඛනය*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහානගර සභා සීමාව තුළ අංක 03 වැලිකඩ කොට්ඨාසයේ පිහිටි මැනුම්පති විසින් පිළියෙල කරන ලද අංක කො. 8943 හා 2008.06.27 දිනැති මූලික පිඹුරෙහි කැබලි අංක 01න් නිරූපිත ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.3616 (අක්කර 00, රූඩ් 03, පර්චස් 22.96) ක් වූ පහත සඳහන් මායිම් වලින් සමන්විත ඉඩම.

| | | |
|---|---|---|
| *උතුරට* | - | කඳුරුගස්තුඩුව නමැති හිමිකම් කියන්නා සොයාගත නොහැකි ඉඩම සහ කො. 8337 වැනි මූලික පිඹුරේ කැබලි අංක 02 ; |
| *නැගෙනහිරට* | - | කො. 7801 වන මූලික පිඹුරේ කැබලි අංක 01 ; |
| *දකුණට* | - | ශ්‍රී ජයවර්ධනපුර මාවත සහ සිමෙන්ති කානුව ; |
| *බටහිරට* | - | සිමෙන්ති කානුව සහ කඳුරුගස්තුඩුව නමැති හිමිකම් කියන්නා සොයාගත නොහැකි ඉඩම. |

01 - 699

1A - G 26922 — 08 (2018/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*